අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112784846
isurupaya@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. } ED/5/67/01/පොදු/01

ඔබේ යොමුව / உமது இல. / Your Ref. }

දිනය / திகதி / Date } 2023.05.11

සියළුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

සියළුම අධ්‍යාපන විද්‍යාපීඨවල පීඨාධිපතිවරුන්,

**<u>2023 පළාත් පාලන ඡන්ද විමසීමට නාම යෝජනා භාර දුන් දේශපාලන අයිතිවාසිකම් හිමි රාජ්‍ය නිලධරයන් සඳහා සහන ලබා දීම - අධ්‍යාපන අමාත්‍යාංශයෙන් පත් කරන ලද අනධ්‍යයන කාර්ය මණ්ඩල සහ ඒකාබද්ධ සේවයට අයත් අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන්</u>**

ඉහත කරුණ පිළිබඳව නිකුත් කර ඇති 2023.05.08 දිනැති අංක 07/2023 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය කෙරෙහි අවධානය යොමු කරවමි.

02. අදාළ චක්‍රලේඛය අනුව අපේක්ෂකයන් ලෙස නාම යෝජනා භාර දුන් රාජ්‍ය නිලධාරීන් ඔවුන් නාම යෝජනා භාර දුන් පළාත් පාලන බල ප්‍රදේශ තුළ නිත්‍ය සේවා ස්ථානය පිහිටන්නේනම් ඔවුන් එම පළාත් පාලන බල ප්‍රදේශයෙන් පිටතට ස්ථාන මාරු කළ යුතුව ඇත.

03. ඒ අනුව 2023 පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා අපේක්ෂකයන් ලෙස නාම යෝජනා භාර දුන් ඔබ යටතේ ඇති ආයතනවල සේවය කරනු ලබන අධ්‍යාපන අමාත්‍යාංශයෙන් පත් කරන ලද අනධ්‍යයන කාර්ය මණ්ඩල සහ ඒකාබද්ධ සේවයට අයත් අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් වෙත ස්ථාන මාරු ලබා දීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පවතින සුදුසු සේවා ස්ථානයක් නම් කර, ඔබගේ නිර්දේශය ද සමඟ කඩිනමින් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි. එසේ ඉදිරිපත් කිරීමේ දී නිලධාරියා නාම යෝජනා භාර දෙන ලද පළාත් පාලන ආයතනය හා ස්ථාන මාරුවීම සිදු කිරීම නිර්දේශ කරන පළාත් පාලන ආයතනය පිළිබඳ තොරතුරු පැහැදිලිව සඳහන් කරමින් නිලධාරියා අදාළ සේවා ස්ථානයට ස්ථාන මාරු වීමට කැමැත්ත ප්‍රකාශිත ලිපියක් ද ඉදිරිපත් කළ යුතුය.

ආර්.බී.හන්කේවල
අතිරේක ලේකම් (අනධ්‍යයන හා ඒකාබද්ධ සේවා)
ලේකම් වෙනුවට

පිටපත් -

1. සියළුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
2. සියළුම ගුරු විද්‍යාල විදුහල්පතිවරුන්
3. සියළුම ජාතික පාසල් විදුහල්පතිවරුන්
4. සියළුම ගුරු මධ්‍යස්ථාන කළමනාකරුවන්

} - කරු.දැ.ගැ.ස.